''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
**Online ISSN: 3051-4924**
https://journals.sjp.ac.lk/index.php/pumithiri
**වෙළුම: 2; I කලාපය;** 2025 **මාර්තු; පිටු:** 15-22

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළින් දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි ඇති බලපෑම

**ඩී. කේ. ජී. හර්ෂ නිලාන් නවරත්න[1] සහ ජී. ජයමාලි වාසනා සඳකැලුනි ජයසිරි[2]**
[1] සම්භාව්‍ය භාෂා අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය;
[2] නර්තන කලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
harshanilan831@gmail.com

**සංක්ෂේපය**

ස්ත්‍රී - පුරුෂ සමාජභාවය දුරාතීතයේ පටන් ම ශ්‍රී ලංකාව මුහුණදෙන ප්‍රධාන ගැටලුවකි. මානව සමාජය බෙදීම්කරණයට අනුව දැකිය හැකි ප්‍රබල බෙදීමක් ලෙස මෙය හඳුන්වා දිය හැකි ය. මෙම බෙදීම ලිංග භේදය අනුව සිදුකරනු ලබයි. ඒ අනුව ස්ත්‍රී පාර්ශවය හා පිරිමි පාර්ශවය ගත්විට එකිනෙකාට වෙනස් වූ කාර්යභාරයන් රැසක් මෙම අසමානතාවය යටතේ අපට හඳුනාගත හැකි වේ. සමාජය දෙස අවධානය යොමුකොට බලන විට ද ස්ත්‍රී පාර්ශවයට අඩු වටිනාකමක් සහ අගයක් ලබා දෙන අතර පිරිමි පාර්ශවයට වැඩි වටිනාකමක් ලබා දීම විවිධ අවස්ථාවන්වල දී දැකගත හැකි ය. මිනිසෙකුගේ ප්‍රාථමික සමාජානුයෝජනය සිදු වන්නේ පවුල තුළින් ය. ඉන් පසුව ඔහු හෝ ඇය තමන් ජීවත් වන සමාජ වටපිටාව සමඟ සංයෝග වෙයි. එහිදී තමන් අත් විඳින ඇසෙන දකින දේවල් සමඟ තම චර්යා රටාව ගොඩනගා ගැනීම නිරායාසයෙන්ම සිදු වන්නකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළින් දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය කෙරෙහි ඇති වන බලපෑම කෙබඳු ද? යන්න මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව වේ. මේ පිළිබඳ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාලය පරිහරණය කරමින් ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික මූලාශ්‍රයන් ආශ්‍රය කොට ගෙන පරීක්ෂා කෙරුණි. මිනිසාගේ අනාගත ජීවන රටාව තීරණය වීමට සමාජානුයෝජනය ඉතා ඍජුවම බලපාන සාධකයක් ලෙස හඳුනා ගැනේ. එහිදී තත් සමාජය තුළ පවතින ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කොයිතාක් දුරට බලපෑම් කරන්නේද යන්න විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව පුමිතිරි භාවය සහිත සමාජයක් තුළ වැඩෙන දරුවන් ද ස්ත්‍රී - පුරුෂ සමාජභාවය කෙරෙහි හැඩගැසෙන බව මෙහි දී අනාවරණය විය. තවද සමාජ විෂමතාවයෙන් තොර තාර්කික චින්තනයෙන් යුත් දරුවෙක් සමාජයට දයාද කිරීමේ අවශ්‍යතාවය මෙහි දී අනාවරණය කර ගැනීමට හැකි විය. ළදරුවෙක් සමාජයට අනුගත කිරීමේ ක්‍රියාවලිය වන සමාජානුයෝජන ක්‍රියාදාමය කෙරෙහි මෙකී සමාජ විෂමතාව ඍජුවම බලපෑමක් එල්ල කරන බව නිගමනය විය.

**මුඛ්‍ය පද:** අසමානතාවය, පවුල, ස්ත්‍රී - පුරුෂ සමාජභාවය, සමාජය, සමාජානුයෝජනය

## හැඳින්වීම

මානව සමාජය විවිධාකාර වූ විභජනයන්ට කවදා කෙසේ කුමන අයුරින් ලක්වූයේ ද යන්න සොයා බැලීම අතිශය බැරෑරුම් කටයුත්තකි. ඒ නිසාම යමෙක් උප්පත්තිය ලබන මොහොතේම එම පුද්ගලයාට සමාජය විසින් බෙදීම් කිහිපයක් ඔස්සේ පැනවීම් සිදු කරයි. ලිංග, ජාති, ආගම්, කුල, වර්ණ ආදි වශයෙන් සිදුකරන බෙදීම් සුලභව සමාජය තුළින් දැකගත හැකි ය. කෙසේ නමුත් යථාර්තවාදී ලෙස විග්‍රහකර බැලූ කල සමස්ත මානව වර්ගයාම ඇස, කන, නාසය, දිව, ශරීරය ආදී කොටැති අංගෝපාංගවලින් සැදුම්ලත් භෞතික වස්තුවකි. එසේම ඉන්ද්‍රියන් හරහා යම් විඳීමක් දරන්නට සිදු වේද එයද පොදු වූ ධර්මතාවයක් ලෙස සිදු වෙයි. යථෝක්ත කරුණුවලින් මොනවට පැහැදිලි වන්නේ යථාර්තවාදී ලෝකය තුළ මිනිසුන් සියල්ලෝම එකම සත්ත්ව කොට්ඨාසයක් වශයෙන් හඳුනාගත හැකි බවයි.

මානව සමාජය බෙදීම්කරණයට අනුව දැකිය හැකි ප්‍රබල බෙදීමක් ලෙස ස්ත්‍රී-පුරුෂ භාවය පෙන්වාදිය හැකි ය. උත්පත්තියේ දී ළදරුවෙක්ට පිහිටන ලිංගේන්ද්‍රියේ ස්වභාවය අනුව මෙම බෙදීම සිදුකර ඇත. මෙකී බෙදුම්වාදය සමාජය තුළ විශාල පෙරළියක් සිදු කරනවා දැකගත හැකි ය. මන්ද යත් මේ අයුරින් ලිංග අවපරිතයකට ලක්වීමට ඇති ජීව විද්‍යාත්මක හේතූන්ට වඩා ඉඳුරාම වෙනස් වූ සාධකයන් කිහිපයක් මේ කෙරෙහි බලපෑම් කොට

ඇති නිසාවෙනි. දරුවෙක් ප්‍රසූත වූවායින් පසුව යමෙක් විසින් අසනු ලබන පළමු ප්‍රශ්නය වන්නේ පිරිමි උපතක්ද? ගැහැණු උපතක්ද? යන්නයි. එයින් පෙනී යන්නේ උප්පත්තියේදී ම මිනිසුන් වෙන්කොට හඳුනා ගැනීමට සමාජය උත්සාහ දරණ බවයි. ඉන් පසුව ගැහැණු හෝ පිරිමි වශයෙන් අන්‍යෝන්‍ය වශයෙන් වෙනස් වූ දෘෂ්ටි කෝණයන් සමාජය විසින් පනවා ගනියි. එයින් කාන්තා පාර්ශවය හා පිරිමි පාර්ශවය තුළ අසමානතාවයක් ගොඩනැගෙයි. එතැන් පටන් මරණයට පත්වන තුරුම ඒ ඒ අය වෙනුවෙන් සමාජය විසින් ගොඩනගාගෙන ඇති සම්මුතීන් සියල්ලම සරල වශයෙන් ස්ත්‍රී - පුරුෂ සමාජභාවය ලෙස අවබෝධ කරගත හැකි ය. මෙයට ''පුම්තිරි භාවය'' යනුවෙන් පර්යාය පදයක් ද වෙයි. මෙය තීරණය කිරීම සඳහා ආර්ථික තත්ත්වය, සංස්කෘතිය, ආගම හා දේශපාලනය යන සාධක හේතු වේ. ඒ අනුව සාමාජීය වශයෙන් සම්මත කරගත් ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට පැවරෙන වගකීම්, කාර්යයන් හා භූමිකා යනාදිය මේ සඳහා අනුගත වේ.

කෙසේ නමුත් ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටක ස්ත්‍රී උපතක් කෙරෙහි යොමු වන්නේ ඍණාත්මක ආකල්පයකි. ගැහැණු දරුවෙක් වෙනුවෙන් පවුලක් විසින් වැය වන මුදල් ප්‍රමාණය පවා වැඩි මට්ටමක පවතින බව සමාජයේ අදහස යි. ඔවුන්ව ආරක්ෂා කිරීමට, කල වයස් පැමිණි පසු විවාහ කර දීම, ඒ සඳහා දෑවැද්ද ආදිය සකස් කර දීම ආදිය ඒ අතර වෙයි. එහෙත් පිරිමි උපතක් වනාහි පවුලට ආයෝජනයක් ලෙස ඔවුහු දකිති. ආවාහ කටයුත්තකදී වුව ද ස්ත්‍රියගේ නිවසින් බඩු බාහිර ආදිය රැගෙන එන්නේ පුරුෂයාගේ නිවසට ය. පවුලක රැකියා ආදිය සිදු කොට මුදල් ඉපැයීම සිදු කරනු ලබන්නේ ද පිරිමි පාර්ශවය විසිනි. එම නිසාම බොහෝ දුරට පවුලක තීරණ ගැනීමේ ආධිපත්‍යය පවා පැවරෙන්නේ පියාට හෝ වැඩිමහල් සොහොයුරාට ය. ඔවුන්ගේ තීරණවලට යටත් වීමට කාන්තා පාර්ශවයට සිදු වෙයි. මෙකී කරුණු ශ්‍රී ලංකාවේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය තුළ ප්‍රකට ව දැකගත හැකි ය. උක්ත කරුණු සියල්ලක්ම සමාජය විසින් පනවාගත් හුදු සම්මුතීන් ගොන්නකි. සම්ප්‍රදායට අනුව පිරිමි පුද්ගලයා වනාහි ඉතා දැඩි, දරදඬු, එඩිතර හදවතකින් යුත් රළු අයෙකි. ස්ත්‍රී පුද්ගලයා වනාහි ඉතා සියුමැලි, ශාන්ත, කම්පිත හදවතකින් යුත් මෘදු අයෙකි.

මෙම තත්ත්වයන් හුදෙක් මිනිසාගේ සමාජානුයෝජන ක්‍රියාවලිය උදෙසා ද ඉවහල් වේ යැයි නිගමනය කළ හැකි ය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළින් දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය කෙරෙහි ඇති වන බලපෑම කෙබඳු ද? යන්න මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව වේ. මිනිසාගේ අනාගත ජීවන රටාව තීරණය වීමට සමාජානුයෝජනය ඉතා ඍජුවම බලපාන සාධකයක් ලෙස හඳුනා ගැනේ. එහි දී තත් සමාජය තුළ පවතින ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කොයිතාක් දුරට බලපෑම් කරන්නේද යන්න විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ බවට වේ. මන්ද ඒ හරහා සමාජයේ පවතින මෙම ගැටලුකාරී විෂමතාව දුරු කිරීම සඳහා සමාජය මුල සිටම අනුගත කිරීමට අවශ්‍ය අවබෝධය ලබා ගැනීමට හැකියාව ලැබේ. එකී ගැටලු සහගත තත්ත්වයන් නිවැරැදිව හඳුනා ගැනීමට මෙම පර්යේෂණය වැදගත් වේ. ස්ත්‍රිය හා පුරුෂයා අතර අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුක්තව කටයුතු සිදු වීම යහපත් සමාජයක ගති ලක්ෂණයකි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම පර්යේෂණය සිදු කෙරුණි. එහි දී මූලික වශයෙන් අවශ්‍ය දත්ත රැස් කිරීමේදී සාහිත්‍යමය මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සිදු විය. එහි දී මාතෘකාව සම්බන්ධ ව ලියවුනු ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය භාවිත කෙරුණු අතර විෂය ප්‍රවීණයන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා ලබා ගත් තොරතුරු ද ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිතයට ගන්නා ලදි, තවද තත් විෂය පරාසයට සම්බන්ධ පර්යේෂණ පත්‍රිකා, පොත්පත්, ශාස්ත්‍රීය ග්‍රන්ථ සඟරා හා අන්තර්ජාලය ඔස්සේ පර්යේෂණයට අදාළ ව ලබාගත් දත්ත ද්විතීයික මූලාශ්‍රය ලෙස භාවිතයට ගන්නා ලදි. මෙසේ ලබාගත් දත්ත තුළින් සංධාර විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ නිගමනවලට එළඹෙන ලදි.

**සාහිත්‍යය විමර්ශනය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළින් දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි ඇති බලපෑම පිළිබඳ වියත් ලේඛකයන් මේ වන විට පර්යේෂණාත්මක හා විමර්ශනාත්මක ග්‍රන්ථ ගණනාවක් එළි දක්වා තිබේ. තත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ එක එල්ලේ හෝ වක්‍රාකාරයෙන් හෝ විෂයානුබද්ධව විවිධ දත්ත සපයනු ලබයි. මාගේ පර්යේෂණයේ හිදැස හඳුනා ගැනීමට මා විසින් සිදු කරන ලද සාහිත්‍යය විමර්ශනය පහත පරිදි වේ. ඒ අනුව ක්‍රිජා ශිවකුමාර් විසින් කරන ලද සහභාගීත්ව පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස "ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහසට එයින්

ඇතිවන බලපෑම (2021)'' නමින් ග්‍රන්ථයක් ප්‍රබන්ධ කරන ලදී. එමගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස්කොට සැලකීම හඳුනාගැනීම සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහස මත ඉන් ඇතිකෙරෙන බලපෑම යනාදී කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වේ. "ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට පත් වින්දිතයින් සඳහා සාධාරණත්වය ඉටු කිරීම(2020)" නමින් කෘතියක් (Inside Justice) ව්‍යාපෘති කණ්ඩායම විසින් එළි දක්වන ලදී. මෙම ග්‍රන්ථය හරහා ලිංගික හිංසනයට ගොදුරු වූ කාන්තාවන් හා ගැහැණු ළමුන් පිළිබඳ යථාර්ථයන් අවබෝධ කර ගැනීමට හැකි වේ. කමලා ලියනගේ සහ සුමුදු වළාකුළුගේ යන අය විසින් "ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය(2006)" නමින් ග්‍රන්ථයක් එළි දක්වන ලදී. මෙම ග්‍රන්ථය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සබඳතා පොදු ක්ෂේත්‍රයේ කටයුතුවලට බලපාන්නේ කෙසේ ද? ස්ත්‍රියට හිමි මෙම අප්‍රධාන තත්ත්වයට හේතුවන මූලික කරුණු මොනවාද? ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමාජානුයෝජනය යනු කුමක්ද? එය වෙනසකට ලක්කළ නොහැකිද? හා එය කෙසේ විස්තර කළ හැකි ද? යන කරුණු කාරණා පිළිබඳව මැනවින් විග්‍රහ කර තිබේ. ජී. ඩී. ධර්මකීර්ති ශ්‍රී රන්ජන් විසින් "ශ්‍රී ලංකා සමාජයෙහි දාරක සමාජානුයෝජනය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්(2004)" නමින් ග්‍රන්ථයක් ප්‍රබන්ධ කරන ලදී. එහි පළමු පරිච්ඡේදය මඟින් සමාජානුයෝජනය යන්න විස්තර කොට තිබේ. එපමණක් ද නොව ශ්‍රී ලංකාවේ දාරක සමාජානුයෝජනයට පාදක වන සමාජ සංස්කෘතික ලක්ෂණ මොනවාද යන්න දෙවැනි පරිච්ඡේදයෙහි විග්‍රහ කොට තිබේ. ''ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා පවුල (2004)'' නමින් ග්‍රන්ථයක් ද එම්. ජී. මනුරත්න විසින් එළි දක්වන ලදි. එම කෘතිය මඟින් සාම්ප්‍රදායික සිංහල පවුල තුළ කාන්තාවන්ගේ කාර්යභාරය වෙනස්වීම, ඒ කෙරෙහි බලපෑ සාධක සහ කාන්තාව වෙනස්වන සමාජය හා අභියෝග පිළිබඳව මෙම කෘතිය තුළ සාකච්ඡා කර තිබේ. එම කෘතිය ද අපගේ පර්යේෂණ කාර්යයට බෙහෙවින් ඉවහල් වේ. යථෝක්ත සාහිත්‍යය විමර්ශනය දෙය අවධානය යොමු කිරීමේදී මාගේ පර්යේෂණයට ප්‍රස්තුත වන ''ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළින් දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි ඇති බලපෑම'' නම් මාතෘකාවේ පර්යේෂණ හිදැස මැනවින් විද්‍යමාන වේ.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

ස්වභාවික සත්වයෙකු ලෙස මෙලොවට බිහිවන මානව ළදරුවා වැඩිහිටි සමාජීය තත්ත්වයට පත් කරනු ලබන ක්‍රියාවලිය ''සමාජානුයෝජනය'' යි. මෙය ජීවිතය පුරාම ගලායනු ලබන දිගු කාලීන සමාජ ක්‍රියාවලියක් බව සමාජ විද්‍යාඥ මතය යි. (ධර්මකීර්ති, 2004) ප්‍රාථමික සමාජානුයෝජනය හා ද්වීතියික සමාජානුයෝජනය වශයෙන් මෙහි ප්‍රභේද දෙකක් හඳුනා ගැනේ. නවමුව උපතක් සිදුවන දරුවෙක්ට පළමුවෙන්ම හමුවන්නේ පවුලයි. එම නිසා එම දරුවාගේ ජීවිතයට වඩාත් සමීපතම ප්‍රාථමික සමාජානුයෝජනය සිදුවන්නේ පවුල හරහා ය. එම නිසා දරුවෙක් සමාජය කෙරෙහි අනුගත කිරීමේ ක්‍රියාවලිය පවුල විසින් ඉතා ඕනැකමින් සිදුකළ යුතු වෙයි. මෙම කාර්යභාරය පියවර කිහිපයක් ඔස්සේ හඳුනාගත හැකි ය. එනම්,

1. ප්‍රජනන කෘත්‍යය.
2. දාරක පෝෂණ කාර්යභාරය.
3. භෞතික පරිසරය හැඩගැස්වීම.
4. අනු සංස්කෘත්‍යායනය. වශයෙනි. (ධර්මකීර්ති, 2004)

ගැහැණු දරුවෙක් ඉපදුණ පසු ඇයගේ පරිහරණය සඳහා යොදාගන්නා භාණ්ඩ රෝස පාටකින් හෝ ලා පැහැයකින් යුත් ඒවා වෙයි. මන්ද යත් එම වර්ණයන්ගෙන් සෞම්‍ය බව සළකුණු වන නිසාවෙනි. පිරිමි දරුවෙක් සඳහා යොදාගනු ලබන්නේ නිල් පැහැයෙන් හෝ ඇසට ක්ෂණිකව ගෝචර වන පැහැයකින් යුත් වර්ණයන් ය. මේ අයුරින් කුඩා කල සිට ම ළදරුවන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරෙහි යොමු කිරීමට උත්සාහ කරයි. ළදරුවන් සඳහා ලබා දෙන්නා වූ සෙල්ලම් භාණ්ඩ තුළින් ද යම් විශේෂයක් වෙයි. බෝනික්කන්, සෙල්ලම් වළං ආදිය ගැහැණු දරුවෙක්ට තිළිණ කරයි. එසේම ගෙදර තුළ කුඩා සෙල්ලම් ගෙවල් සාදාගෙන සෙල්ලම් බත් ඉවීමට තේරෙන වයසේ සිට ම ගැහැණු දරුවෝ පෙළඹෙති. තම මව්වරු එසේ මුළුතැන්ගෙට වී සිදු කරන කාර්යයන් දකිමින් ඒ තුළින් ඇතිවෙන්නා වූ පෙළඹවීම මත ගැහැණු ළමයි මෙසේ අනුගත වෙනවා විය හැකි ය. කුඩා පිරිමි දරුවෙක්ට තිළිණ වන්නේ සෙල්ලම් තුවක්කු, සෙල්ලම් වාහන, බැට්, බෝල් ආදිය යි. මේ දේවල් හරහා ඔවුන් කුඩාකල සිට ම රිය දාවනය, යුද්ධ ආශ්‍රිත හැසිරීම්, ක්‍රිකට් ගැසීම් වැනි ප්‍රධාන ක්‍රීඩාවන් කෙරෙහි යොමුවීමක් දක්නට හැකි ය.

ගැහැණු ළමයෙක් සමාජානුයෝජනය කිරීමේ දී ඇයගේ චර්යා රටාවන් පාලනය කිරීම සඳහා විශේෂයෙන් මව විසින් විවිධ තහංචි යොදාගනු ලබයි. නිවසට යමෙක් පැමිණි පසු ගැහැණු ළමුන් මුළුතැන්ගෙට හෝ කාමරයකට සීමා වෙති. ඔවුන් සමඟ ඉදිරියට ගොස් කතා කිරීමට අවස්ථාව

හිමිවන්නේ පිරිමි පාර්ශවයට පමණි. පිරිමින් සමඟ තනිව කතා කිරීමට හෝ ඔවුන් සමඟ දුව පැන සෙල්ලම් කිරීමට අවසර හිමිවන්නේ නැත. තනිව ගෙදරින් පිටව යාමට ද අවස්ථාව නොලැබෙයි. දෙමව්පියන්ට කීකරුව නිවසේම රඳවා ගැනීමට බොහෝ සෙයින් ගැහැණු දරුවෙක් යොමු කරවයි. එහෙත් පිරිමි දරුවෙක්ට තම අභිමතය පරිදි දුව පැන ඇවිද හැසිරීමට අවස්ථාව උදාවෙයි. පිරිමි දරුවන් වනාහි කඩිසරව ක්‍රියා කළ යුතු යැයි අපේක්ෂාවෙයි. ඔවුන් අකීකරු වීම හෝ මුරණ්ඩු වීම දෙමව්පියන් විසින් වැඩි තැකීමකට ලක් නොකරති. ඇදුම් පැළඳුම් භාවිතයේ දී ද කුඩාකල සිට ම ගැහැණු දරුවන් අපහසුවෙන් නමුත් සමස්ත ශරීරයම ආවරණය වන පරිදි ඇඳුම් පැළඳිය යුතු ය.

දරුවන් වැඩිහිටි බවට පත් වීම ස්ත්‍රී - පුරුෂ දෙපාර්ශවයටම සාධාරණ වූ සංසිද්ධියකි. එහිදී ද ගැහැණු ළමයෙක් වැඩිවියට පත් වීම කෙරෙහි සමාජයේ විශේෂ අවධානයක් යොමු වෙයි. මේ වෙනුවෙන් භාවිත වන විශාල ව්‍යවහාර ප්‍රමාණයක් ද ලංකා සමාජය තුළින් හමුවෙයි. එය ප්‍රාදේශීය ව්‍යවහාරයට අනුව සිදුවන්නක් ද විය හැකි ය. ඒ අතර ''කිළි හොඳ වෙනවා'', ''පීදෙනවා'', ''මල්වර වෙනවා'', ''කොටහළු වෙනවා'', ''ලොකු ළමයෙක් වෙනවා'' යනාදිය ප්‍රසිද්ධ ව්‍යවහාර වෙයි. මල්වර වූ ගැහැණු ළමයෙක්ට යම් තහංචි ප්‍රමාණයක් අත් විඳීමට සිදුවෙයි. විශේෂයෙන්ම ඉන්පසු ඇය කෙරෙහි විශාල අවධානයක් පවුල තුළින් යොමු වෙයි. නිරන්තරයෙන් යන එන තැන්වලදී හුදෙකලාව ගමන් කිරීමට නො දෙයි. ගොම්මනට පෙර ගමන් ආදිය අවසන් කිරීමට සිදුවෙයි. කොන්ඩය කඩාගෙන ඇවිදීමට අවස්ථාව නොදෙයි. මල්වර වීමට ආසන්න කාලසීමාව තුළ ද දුර ගමන් ආදිය රැගෙන යාමට දෙමව්පියන් අකැමැති වෙයි. මල්වර වූ ගැහැණු ළමුන් කෙරෙහි ඇතැම් නූගත් තරුණයන්ගේ ද අනිසි අවධානය යොමු වෙයි. එය ද ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ ප්‍රතිඵලයක් ලෙස දැකිය හැකි ය. පිරිමි දරුවෝ ද මෙසේ වැඩිවියට පත් වෙති. නමුත් ඒ බව දැනගැනීමටවත් හැකියාවක් නොවෙයි. ඊටත් වඩා ඒ කෙරෙහි සමාජයේ කිසිදු අවධානයක් යොමු නොකරයි. තවද තම දෙමව්පියන්ගෙන් හෝ සමාජයෙන් කිසිදු බලපෑමක් නොලැබෙයි.

අධ්‍යාපන කාලසීමාව තුළ ද ස්ත්‍රී - පුරුෂ සමාජභාවය දැකගත හැකි ය. ගැහැණු පාසල්, පිරිමි පාසල් ලෙස වෙන වෙනම පාසල් පද්ධතීන් බිහි වීම ද මෙකී සමාජානුයෝජනය කෙරෙහි දැඩි සෙයින් ඉවහල් වූවා විය හැකි ය. පවුලක ගැහැණු ළමුන්ට වඩා පිරිමි ළමුන් අධ්‍යාපනය කෙරෙහි යොමු කිරීමේ ප්‍රවණතාවය වැඩි වෙයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ද පාඩම් සටහන්වලින් පවා පෙන්වා දෙන්නේ ස්ත්‍රිය සුවච කීකරු විය යුතු බවත් පවුලක ප්‍රධාන චරිතය බවට පත්වන්නේ පිරිමි පුද්ගලයා බවත් ය. ඒ අනුව පවුල් වටපිටාවකට හැඩගැසීමට අවශ්‍ය උපදෙස් පාසල තුළින් ලබාදෙයි. පාසල් විෂයමාලාව තුළ ද ස්ත්‍රී - පුරුෂ කාර්යයන් වෙන්කොට දැක්වීමක් දක්නට ලැබේ. මැහුම්, ගෘහ ආර්ථික විද්‍යාව ආදී විෂයන් දෙසට ගැහැණු ළමුන් යොමුකෙරෙන අතර පිරිමි ළමුන් කෘෂිකර්මය, වඩු වැඩ, කාර්මික ශිල්ප ආදී අංශ වලට යොමු කිරීමක් දක්නට පුළුවන. මෙලෙස මෙම කාර්යයන් වෙන් වෙන් වශයෙන් ගැහැණු පිරිමි ලෙස තිබීම තුළින් ඔවුන්ගේ කාර්යයභාරයන් පිළිබඳ අවබෝධ කරගැනීමට උත්සාහ ගැනේ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ද තරුණියන් බොහෝ පිරිසක් යොමු වන්නේ කලා විෂය ආශ්‍රිත විෂයයන් ඔස්සේ අධ්‍යාපනය හැදෑරීමටය. ඉංජිනේරු, කාර්මික ආදි ක්ෂේත්‍රයන් කෙරෙහි වැඩි යොමු කිරීමක් සිදුවන්නේ තරුණයන් ය. මෙයින් පෙනී යන්නේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ද පවතින බවයි.

රැකියාවන්වල අනුයුක්ත වීමේදී මෙය ඉතාමත් කැපී පෙනෙන ලක්ෂණයකි. එහිදී ''පිරිමි වැඩ'' හා ''ගැහැණු වැඩ'' යනුවෙන් වර්ගීකරණය කොට හඳුනාගැනීම විශේෂයෙන් දැකිය හැකි ය. ස්ත්‍රීන් බොහෝ අවස්ථාවල ගුරුවරියන්, හෙදියන්, දුරකථන ක්‍රියාකරවන්නියන්, ලිපිකාරිනියන් වැනි තනතුරු හා ඒ ආශ්‍රිත රැකියාවන් කෙරෙහි යොමු වෙයි. කර්මාන්ත ක්‍රියාකරුවන්. රියදුරන්. කළමණාකරුවන්, ඉංජිනේරුවන් ආදි සමාජය විසින් හඳුන්වන බර වැඩ කෙරෙහි යොමු කරවන්නේ පිරිමි පුද්ගලයන් ය. මෙහිදී විශේෂයෙන්ම නිවසේ සිට යා හැකි හා නැවත නිවසට පැමිණිය හැකි රැකියාවන් කෙරෙහි ස්ත්‍රීන් යොමු කිරීමට දෙමව්පියෝ කටයුතු කරති. පිරිමි පුද්ගලයින් දින ගණනක් ඇතැම් විට මාසයකටත් එහා කාලයක් නිවසින් බැහැරව ගොස් රැකියාවල නියුතු වෙති. එහි වැටුප ද අනෙක් ඒවාට වඩා සාපේක්ෂව වැඩි අගයක් ගනියි. බොහෝ සෙයින් විවාහයෙන් පසු ස්වකීය රැකියාවන් අත් හැරීමට සිදුවන අවස්ථාවන් ද ස්ත්‍රී පාර්ශවයට හිමි වෙයි. එමනිසා අවිවාහක කාන්තාවන්ට රැකියා ලබා ගැනීමේ දී ද යම් යම් ගැටලු මතු වෙයි. තවද ඇතැම් පෞද්ගලික ආයතනවල කාන්තාවන් සඳහා වෙනම වැටුප් ප්‍රමාණයකුත්, පිරිමි පාර්ශවය සඳහා වෙනම වැටුප් ප්‍රමාණයකුත් ලබා දෙන බව දැකගත හැකි ය.

ඉතාමත් අඩු වේතනයක් ලැබෙන ලංකාවේ ඇඟලුම් කර්මාන්තයන්හි වැඩි වශයෙන් සේවයෙහි නිරත වන්නේ කාන්තා පක්ෂයේ පිරිස් වෙති. මෙකී රැකියා විෂමතාවය ද දරුවන් සමාජයට අනුගත කිරීමේ දී බලපෑනු ලබන බව ප්‍රකට වේ.

ස්ත්‍රී - පුරුෂ දේපාර්ශවයටම ජීවිතයේ අත් විඳීමට ලැබෙන ඉතා සුවිශේෂී අවස්ථාවක් ලෙස විවාහ ගිවිස ගැනීම හැඳින්විය හැකි ය. එහිදී ද ස්ත්‍රියක් විවාහ කරදීමේ දී සමාජය විසින් විවිධ මිනුම්දඬු භාවිත කරයි. විශේෂයෙන්ම ස්ත්‍රී පාර්ශවයෙන් හිමිවන දෑවැද්ද කෙරෙහි බොහෝ දෙනා අවධානය යොමු කරති. තවද ස්ත්‍රියගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව ද, ගෙදර දොර වැඩවල පුහුණුව පිළිබඳව ද පරීක්ෂා කිරීමට ලක්වෙයි. පවුලේ අන් අයගේ හැසිරීම් රටාව හා ජීවන රටාව ද ඇතැම් විට ඇයගේ විවාහය කෙරෙහි බලපෑමක් ඇතිවන බව පෙනේ. තවද විවාහයෙන් පසුව ස්ත්‍රියගේ කන්‍යාභාවය පිළිබඳ පරීක්ෂාකර බැලීමක් ද ඇතැම් සමාජ පරිසරයන්හි දැකිය හැකි ය. එනමුත් පිරිමි පාර්ශවයේ උක්ත තතු පිළිබඳ විශේෂ අවධානයක් යොමු නො කරයි.

ස්වකීය වර්ගයා බෝ කිරීම උදෙසා සියලුම සත්ත්වයෝ ප්‍රජනන ක්‍රියාවලියෙහි නිරත වෙති. ඒ අනුව ශාරීරික හා මානසික යහපැවැත්ම උදෙසාත්, පවුල තුළ සැමියා හා බිරිඳ අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය යහපත් අන්දමින් පවත්වා ගැනීම පිණිසත්, මිනිසුන් ලිංගික චර්යාවේ යෙදෙති. එකී ලිංගික ක්‍රියාවලිය තුළ ද පිරිමි පුද්ගලයා ප්‍රධානත්වයක් උසුලන බව සමාජයේ පිළිගැනීමයි. තවද එහිදී පුරුෂයා උපරිමයෙන් ලිංගික ආශ්වාදයක් ලැබුව ද ස්ත්‍රියගේ තෘප්තිය කෙරෙහි විශේෂ උවමනාවක් නො දක්වයි. මේ සියල්ලටම පාහේ ඉවහල් වන්නේ එක් එක් සමාජයන්හි පවතින ස්ත්‍රී - පුරුෂ සමාජභාවය යි. දරුවන් බිහි කිරීමේ දී ද වැඩි වගකීමක් හිමි වන්නේ මවට යි. ගර්භනී කාල සීමාව තුළ දරුගැබ ආරක්ෂා කරගැනීමේ විශාල වගකීමක් පැවරෙන්නේ මවට යි. ඒ වෙනුවෙන් පිළිපැදිය යුතු විවිධ නීති රීති මාලාවක් සමාජය විසින් මවට ආරූඪ කරනු ලබයි. එසේම දරුවා බිහිකිරීමෙන් පසුව ද බිළිඳාගේ සියලු කටයුතු සිදු කරමින් රැකබලා ගැනීමට සිදුවන්නේ මවට යි. එතැන් පටන් දරුවන්ගේ වැඩකටයුතු ද සිදුකරමින් ගෙදර දොර වැඩ කටයුතු හා ඉවුම් පිහුම් කටයුතු ද බිරිඳ විසින් සිදු කරයි. එසේ නමුත් ළදරුවන් සඳහා නම් තැබීමේ දී පවා පියාගේ වාසගම යොදාගනිමින් පිය පරම්පරාවේ අනන්‍යතාවය තහවුරු කිරීම ශ්‍රී ලංකා සමාජය තුළ දක්නට ලැබෙයි. සැමියා රැකියාවක නිරත වෙමින් පවුල නඩත්තුව සඳහා අවශ්‍ය මුදල් ආදිය රැස් කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වන අතර සැමියාට දවසේ නියමිත කාල පරාසයක් තුළ සිය රැකියාවේ යෙදීමට හැකි වේ. එහෙත් බිරිඳ සියල්ලෝට ම පෙර අවදිව සියල්ලෝට ම පසුව නින්දට යයි. එදිනෙදා පවුල් ජීවිතයේ වැඩි කොටසක් වැඩ කිරීමට පැවරෙන්නේ බිරිඳට ය. ඉන්පසු දරුවන්ව සමාජානුයෝජනය කිරීමේ වගකීම පැවරෙන්නේ ද බොහෝ සෙයින් මව් පාර්ශවයට යි. එසේ වුවද දරුවන් වැදීමට හැකියාවක් නොමැති කාන්තාවන් ''වඳ ස්ත්‍රීන්'' යනුවෙන් පවසා සමාජයේ පිළිකුලට ලක්කරති. එපමණක්ද නොව ඔවුන් දැකීම ද අසුබ ලකුණක් ලෙස සමාජ සම්මතයක්ව පවතියි.

මෙසේ සමස්තයක් ලෙස බැලූ විට මෙකී ස්ත්‍රී - පුරුෂ අසමානතාවය සෑම සමාජයක් තුළින්ම දැකිය හැකි ලක්ෂණයකි. විශේෂයෙන්ම පිතෘ ආධිපත්‍යයක් පවතින දකුණු ආසියාතික රටවල සමාජයේ ප්‍රධානම කාර්යයන් පුරුෂයන් වෙත පවරාගෙන ඇත. විශේෂයෙන්ම ගෘහාශ්‍රිත කාර්යයන් සියල්ලක්ම පාහේ පවරා ඇත්තේ කාන්තාවටයි. අනෙක් පවුලෙන් බැහැරව ඇති සමාජමය කාර්යයන් සඳහා නිරන්තරයෙන් ප්‍රමුඛත්වයක් දරණු ලබන්නේ පුරුෂයන් විසිනි. මේ කරුණු සියල්ලම දාරක සමාජානුයෝජනයේදී වැදගත් වෙයි. සමාජයේ කුඩාම ඒකකය වන පවුල තුළින්ම සමාජානුයෝජන ක්‍රියාවලිය තුළ මෙකී ස්ත්‍රී - පුරුෂ සමාජභාවය වර්ධනය වන බව උක්ත සාකච්ඡාවන් තුළින් මොනවට අවබෝධ කරගත හැකි වේ. කරුණු සම්පිණ්ඩනයක් කොට බැලූ කල ස්ත්‍රී - පුරුෂ අසමානතා පහත පියවරයන් ඔස්සේ සිදු වෙයි.

1. ඇඳුම් මෝස්තර.
2. සෙල්ලම් භාණ්ඩ.
3. රැකියා.
4. හැසිරීම් රටා.
5. ගැහැණු අයට කළ හැකි දේ හා පිරිමි අයට කළ හැකි දේ.
6. ගැහැණු හා පිරිමි දෙපාර්ශවයන්ට සමාජය හා පවුල තුළ හිමි වන ස්ථානය.
7. ගැහැණු හා පිරිමි දෙපාර්ශවයට පවුල තුළ ඇති වගකීම.

මේ අයුරින් ප්‍රධාන වශයෙන් ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හඳුනා ගැනේ. බොහෝ දුරට පවුලක් තුළ දැක ගැනීමට හැකිවන්නේ සමාජ පසුබිම් දෙකක සුසංයෝගයකි. එනම් සැමියා ජීවත් වූයේ වෙනම පවුල් සමාජයක වන අතර මව ජීවත් වූයේ තවත් සමාජ පසුබිමක ය. දරුවෙක් බිහි වූවායින් පසුව ඔහුට හෝ ඇයට මෙකී පවුල් පසුබිම් දෙකෙහිම

ආභාසයන් අඩුවැඩි වශයෙන් හෝ ලැබිය හැකි ය. කෙසේ නමුත් දරුවාගේ බාල කාලයේ වැඩි කාලයක් මව සමීපයේ ගත වන නිසාවෙන් මව් පාර්ශවයේ පුරුදු පුහුණු වැඩි වශයෙන් ලැබීමේ සම්භාවිතාවය ඉහළ මට්ටමක පවතියි. විශේෂයෙන්ම ගැහැණු දරුවෙක් තමන් යුගදිවියට පිවිසීමට ආසන්න කාලසීමාව වනතුරුම ඉතා සමීපව ඇසුරු කරනු ලබන්නේ තම මව්තුමිය වේ. මේ නිසාවෙන් එම මව් තුමිය ලැබූ අත්දැකීම් හා ඇය සතු ආකල්ප නිරායාසයෙන්ම තම දියණිවරුන්ට ද අනුගත විය හැකිය. මෙසේ දරුවන් සමාජානුයෝජන ක්‍රියාවලිය වර්තමානය වන විට ඉතා පුළුල් සංකල්පීය එළඹුම් කිහිපයක් ඔස්සේ වර්ගකර හඳුනාගැනීමට හැකියාව ලැබී තිබේ. එනම්,

1. මානව විද්‍යාත්මක එළඹුම.
2. මනෝ විද්‍යාත්මක එළඹුම.
3. සමාජ විද්‍යාත්මක එළඹුම (ධර්මකීර්ති, 2004)

උක්ත සියලුම ආකාරයේ එළඹුම් හරහා සමාජය තුළට දරුවෙක් දායාද කිරීමේ දී මූලික පදනම ලැබෙන්නේ පවුල තුළින් බව නො රහසකි. මේ කුමන ආකාරයෙන් විමසා බැලුවද ස්ත්‍රී - පුරුෂ සමාජභාවය ඍජුවම බලපෑම් සිදු කරයි. මෙකී ලිංගික විභජනයේ කරුණු ස්වභායෙන්ම පදනම් වන්නේ මානව විද්‍යාව සමඟයි. ඒ තුළින් ලැබෙන්නා වූ අභාසය සමාජ විද්‍යාවට අන්තර්ගත වෙයි. දරුවෙක් තමන් ජීවත් වන සමාජය තුළ ඇති චර්යා රටාවන් අත්විඳීමට සිදුවීම හරහා මනෝ විද්‍යාත්මකව ඒ කෙරෙහි අනුගත වීමක් දැකිය හැකි ය. මෙයින් පැහැදිලි වන්නේ යමෙක් තමන්ට මුල් කාලීනව අත්විඳීමට සිදුවන සිද්ධීන් හරහා තමන්ගේ පෞරුෂය වර්ධනය කරගන්නා බවයි. මෙකී පෞරුෂ වර්ධනය සමාජ පිවිසුමක දී දරුවෙක් ට ඍජු බලපෑමක් එල්ල කරයි. ළදරුවෙක් ස්වකීය ප්‍රාථමික සමාජානුයෝජන කාල සීමාව තුළ ඉතා වේගයෙන් පරිණාමයට පත්වෙයි. මෙහිදී විශේෂ කාර්යභාරයක් හිමිවන්නේ පවුලට යි. එනම්,

1. දාරක ශරීර වතාවත් විධිමත්ව හුරු කිරීම.
2. සමාජ වටිනාකම් හා ඇගයුම් තෝරා බේරා දීම.
3. පරිසරය තේරුම් ගැනීමෙහිලා ඉවහල් වන සමාජ ආකල්ප ඇති කිරීම.
4. ජන සන්නිවේදන මාධ්‍යයන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට හුරු කිරීම.
5. වැඩිහිටි දාරක පරිසරයේ විෂමතා වෙනුවට ඒ තුළින් ආරක්ෂාව පිළිබඳ හැඟීම් දරුවා තුළින් කුළු ගැන්වීම. (ධර්මකීර්ති, 2004)

මව හා පියා මුල්ව මෙම ඉහත අනු සංස්කෘත්‍යායන කාර්යය පදනම්ව විධිමත් චර්යා සාධනීය තත්වයක් දරුවා තුළ නිර්මාණය වනු දැකිය හැකි ය. තවද දරුවන් සමාජය සමඟ අන්තර් ක්‍රියාවන් ආරම්භ කිරීමට පෙර දෙමව්පියන් හා දරුවන් අතර සිදුවන අන්තර් ක්‍රියාවන් ඍජුවම සමාජානුයෝජනය කෙරෙහි බලපෑම් ඇතිකරයි. මෙම අන්තර් ක්‍රියාදාමයන් වයස, ලිංගිකත්වය, ස්වාමියා, බිරිඳ, පවුලේ එකමුතු බව, වගකීම් සහිත බව ආදී තත්ත්ව මත පදනම් වෙයි. විශේෂ වශයෙන් අවස්ථා තුනක් ඔස්සේ මෙකී අන්තර් ක්‍රියාවන් හඳුනා ගැනේ.

1. ඉන්ද්‍රියාත්මක අන්තර් ක්‍රියාව.
2. චිත්තවේගී අන්තර් ක්‍රියාව.
3. බුද්ධිමය අන්තර් ක්‍රියාව. (ධර්මකීර්ති, 2004)

මෙකී සියලු කාරණා දෙස අවධානය යොමු කරන්නේ නම් ස්ත්‍රී - පුරුෂ සමාජ අසමානත්වය දාරක සමාජානුයෝජනය කෙරෙහි ඉවහල් වන බව සිතිය හැකි ය. මෙම කරුණු කාරණා පදනම් කරගෙන සමාජය තුළ හා පවුල තුළ විවිධාකාර ගැටුම් නිර්මාණය වීම ද බහුල වශයෙන් දැකගත හැකි ය.

**සමාලෝචනය**

යම් බිළිඳෙකු ගැහැණු හෝ පිරිමි දරුවෙක් වශයෙන් හඳුනා ගන්නේ ලිංගේන්ද්‍රිය මඟිනි. ජීව විද්‍යාත්මකව එසේ බේදීමකට ලක් කෙරුව ද සමාජ හා සංස්කෘතික වටපිටාව මැද ස්ත්‍රිය හා පුරුෂයා වටා බැඳුණු වෙන් වෙන් වශයෙන් පවතින සමාජ භූමිකාවක් ඇත. මෙසේ අන්‍යෝන්‍ය වශයෙන් සමාජයේ යථෝක්ත සාකච්ඡා කරන ලද නොයෙක් අතින් වෙනස්ව පවතින අසමානතාවය ස්ත්‍රි - පුරුෂ සමාජභාවය ලෙස හඳුනාගෙන තිබේ. මේ හේතුවෙන් එකම සමාජයක වෙසෙන කාන්තා පාර්ශවය හා පිරිමි පාර්ශවය අතර වෙනස් වූ චර්යා රටාවන් දැක ගත හැකි ය. එහි දී වැඩි වාසි සහගත තත්ත්වයක් පුරුෂයාටත් අඩු වාසිදායක පැතිකඩ ස්ත්‍රියටත් හිමිවන බව මොනවට අවබෝධ කරගත හැකි වේ. විශේෂයෙන්ම පීතෘ මූලික සංකල්පය මුල් බැසගත් අසියාතික රටවල මෙම ලක්ෂණය කැපී පෙනේ. ඒ අනුව එකී කාරණය ශ්‍රි ලංකාවටත් සාධාරණ වී ඇති ආකාරය මෙහිදී අනාවරණය වේ. කෙසේ වෙතත් මෙම ස්ත්‍රි - පුරුෂ සමාජභාවය දරුවෙක් සමාජය කෙරෙහි අනුගත වීමේ ක්‍රියාවලිය වන සමාජානුයෝජනය කෙරෙහි කෙතෙක් දුරට බලපානු ලබන්නේ ද යන්න විමසා බැලීම යුක්ති යුක්ත වෙයි. එහි දී දරුවෙක්ගේ ජීවිතයට අතිශයින් වැදගත් වන ප්‍රාථමික සමාජානුයෝජනය කෙරෙහි ඉවහල් වන තමන් ජීවත්වන පවුල් පරිසරයේ ස්වභාවය මෙහි දී සාකච්ඡා විය. විශේෂයෙන්ම

තමන්ගේ පෞරුෂ සංවර්ධනයට මෙම සමාජභාවය බලපානු ලබයි. මෙහි දී තමන් දකින සහ අත්විඳින දේවල් යහපත් අන්දමින් පවත්වා ගෙන යාම පියාගේ හා මවගේ පූර්ණ වගකීම වනු නො අනුමාන ය. එහෙත් දරුවෙක් සමාජයට අනුගත වීමේ දී තමන් වැදෙන වැඩෙන වටපිටාවට අනුව ජීවන රටාව හැඩගැසීම සමාන්‍ය සංසිද්ධියකි. විශේෂයෙන්ම සමාජයේ පවතින පුමිතිරි භාවය එම සමාජයෙන් බිහිවන පුද්ගලයන්ට ද බලපානු ලබන බව මෙහි දී නිගමනය විය. මෙම විෂමතාවය පාලනය කිරීමටනම් දරුවෙක් ළමාවියේ සිටම ඒ සඳහා හුරු කිරීමේ වැදගත්කම මෙයින් මැනවින් ස්ඵුට වේ. එය හුදෙක් සමාජ වගකීමක් ලෙස වටහාගත යුතු වේ. නිවහල් මානසික සුවයකින් යුතුව ජීවන රටාව ගොඩනගා ගැනීමට එය මැනවින් උපකාරී වේ. වර්තමානයේ පවතින සමාජ සංකීර්ණතාවයත් තාක්ෂණික දියුණුවත් සමඟ සාම්ප්‍රදායක චින්තාවෙන් ඔබ්බට ගොස් නිවහල් චින්තනයන් ඔස්සේ ගමන් කිරීමට අවශ්‍ය වටපිටාව සමාජය තුළ නිර්මාණය වී ඇත. මේ නිසාවෙන් තාර්කික චින්තනය හරහා දරුවන් හට ලබාදිය යුතු දැනුම ලබා දීමට මෙන්ම ආකල්ප සංවර්ධනයටත් ඉඩහසර ලබා ගැනීමට පුළුවන. ඒ තුළින් සමාජය තුළ ස්ත්‍රිය හා පුරුෂයා වෙන්කොට හඳුනා ගන්නවා වෙනුවට යථාර්ථවාදී ව හඳුනා ගැනීමට දරුවන්ගේ බුද්ධිමට්ටම් සක්සවනු ඇතැයි නිගමනය වේ. හුදෙක් එය සමාජ යහපැවැත්මට එහා ගිය සදාචාරමය යහපැවැත්ම වෙනුවෙන් ද මහඟු පිටිවහලක් වනු නො අනුමාන ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ආරියපාල, ඇම්. බී. (1962). මධ්‍ය කාලීන ලංකා සමාජය. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඊරියගොල්ල, ඉන්ද්‍රාණී. (2006). සත්‍රී පුරුෂ සමාජභාවය : සංකල්පය හා භාවිතය. කොළඹ : කොන්රඩ් අඩිනවර් ව්‍යාපෘතිය.

ජයසිංහ, ඒ. කේ. ජී. (2005). සමාජ ස්ථරායනය. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මකීර්ති, ජී. ඩී. (2004) ශ්‍රී ලංකා සමාජයෙහි දාරක සමාජානුයෝජනය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මනුරත්න, එම්. ජී. (2004). ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා පවුල. ගනේමුල්ල : ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්.

රත්නපාල, නන්දසේන. (2001). මානව විද්‍යාව. ගනේමුල්ල : ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්.

ශිවකුමාර්, ක්‍රිජා. (2021). කරුණාරත්න, සී. ජී. (පරි) ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැළකීමේ සමාජ ප්‍රතිමාන සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහසට එයින් ඇතිවන බලපෑම. කොළඹ 08 : නීතිය හා සමාජ භාරය.

ලියනගේ, කමලා., සහ වළාකුළුගේ, සුමුදු. (2006). ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය. කොළඹ 04 : ෆ්‍රෙඩ්රික් ඊබට් පදනම.